ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක: 01/2017

මගේ අංකය: PA/CS/POLICY/කා.ක. විභාග IV
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2017.02.16 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**<u>රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම.</u>**

2004.01.01 දින සිට 2013.12.11 දින දක්වා කාලසීමාව ඇතුළත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට පත් වූ සහ එම කාලය තුළ II වන ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා ඔවුන්ගේ පත්වීමේ/උසස්වීමේ දින සිට ඉදිරියට පවත්වන ලද අනුයාත විභාග අවස්ථා හයක් (06ක්) දක්වා සහන කාලයක් පහත සඳහන් විධිවිධානයන්ට යටත්ව ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව මෙයින් දන්වමි.

02. මීට පෙරාතුව එම නිලධාරීන් සඳහා පොදුවේ අනුයාත විභාග අවස්ථා හතරක (04ක) සහනයක් පමණක් ලැබී තිබූ අතර ඊට පසුව පැවති විභාග අවස්ථාවකදී කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වූ විට, වැටුප් වර්ධකය විලම්භනය කරන ලදී. එහෙත් ඉහත සහනය හේතුවෙන් අනුයාත විභාග අවස්ථා හයක් (06ක්) දක්වා වැටුප් වර්ධක විලම්භනයවීමකින් තොරව III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට/සම්පූර්ණ කර ගැනීමට නිලධාරීන්ට අවස්ථාව හිමි වන බැවින් එම සහන කාලයට අදාළ වැටුප් වර්ධක උපයා ගැනීමට මෙ මගින් අවස්ථාව හිමි වනු ඇත.

03. ඉහත 02 ඡේදයේ දැක්වූ පරිදි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම ප්‍රමාදවීම මත වැටුප් වර්ධක විලම්භනය වීම හේතුවෙන්;

i. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 111 වැනි වගන්තිය යටතේ පරිවාස කාලය දීර්ඝ කර ඇති III ශ්‍රේණියේ නිලධාරීන් ද
ii. II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වීමට නොහැකි වූ නිලධාරීන් ද සහ
iii. ඉහත හේතු මත සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන ශ්‍රේණියේ සහ I වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද

මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය අනුව වූ II වන සහ I වන ශ්‍රේණියේ උසස්වීම් (2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.3 සහ 12.3 වගන්ති යටතේ සඳහන්) <u>පමණක්</u> යථාවත් කරගැනීම සඳහා සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

04. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු / අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේ දී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද ඒ පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භන හේතුවෙන් අහිමි වූ වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (2004.12.24 දිනැති සේවා ව්‍යවස්ථාවේ 11.2 සහ 12.2 වගන්ති යටතේ සඳහන්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරහ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම්/වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කරන අභියාචනා.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක: PSC/APP/4/90/2015 හා 2016.01.19 ලිපියෙන් දන්වන ලද එම කොමිෂන් සභා තීරණයට අනුව 2004.12.24 දින දක්වා දීර්ඝ කරන ලද ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 01/2009 හි විධිවිධාන යටතේ එදිනට පෙර රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන ශ්‍රේණියට උසස්වීම් ලද නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්වීම සඳහා විභාග අවස්ථා හයක (06ක) සහනයක් ලබා දී ඇති බැවින් එම සහනය ඉක්මවා මෙම චක්‍රලේඛය මගින් ඔවුනට සහන හිමි නොවේ.

06. ඔබගේ පහසු අවධානය සඳහා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ III ශ්‍රේණියට සහ II වන ශ්‍රේණියට අදාළව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇති දිනයන් පහත දක්වා ඇත.

| III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වූ දිනයන් | |
|---|---|---|
| | විභාග දිනය | ඒ.සේ.ච.ලේ.01/2009 මගින් පෙරදාතම් කර ඇති දිනය |
| 2007.03.31 | 2007.03.31 | 2005.01.01 |
| 2008.08.30 | 2007.12.08 | 2005.07.31 |
| 2009.07.26 | 2008.10.25 | 2006.01.31 |
| 2010.07.17 | 2009.11.21 | 2006.07.31 |
| 2011.10.01 | 2010.11.13 | 2007.01.31 |
| 2013.01.27 | 2011.12.24 | 2007.07.31 |
| 2014.06.29 | 2013.03.16 | - |
| 2015.09.19 | 2014.05.10 | - |
| | 2015.05.23 | - |

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත: සියළුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් වෙත - කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස.